# Sri Lanka registers strong protest with Canada on House of Commons motion

**mfa.gov.lk**/cahocom/



Minister of Foreign Affairs Prof. G.L. Peiris registered the Government of Sri Lanka's emphatic protest and deep concern over the adoption of a motion in the Canadian Parliament on 18 May 2022 on the alleged genocide of Tamils in Sri Lanka.

In a meeting with the Acting High Commissioner of Canada in Sri Lanka Amanda Strohan at the Foreign Ministry on Friday 20 May 2022, the Foreign Minister categorically rejected the blatantly false content of the motion, and highlighted that its erroneous substance is fundamentally inconsistent with and contradicts the position of the Government of Canada that "it has not made a finding that there was genocide in Sri Lanka." Minister Peiris also pointed to the need for such technical terms with specific legal connotations to be used with caution and responsibility, as well as to the dangers of its seeming endorsement by any senior members of the Canadian Government.

Considering the inaccurate and prejudicial nature of the motion, as well as the negative perceptions on Sri Lanka generated in the public domain as a result of such conduct, the Foreign Minister requested the Canadian Government to take appropriate action to correct the fallacies contained in the motion. The latter request was conveyed in the context of the strong bilateral relations of over six decades existing between Sri Lanka and Canada.

In response, Acting High Commissioner Strohan referred to the non-binding, non-legislative nature of the private members' motion adopted in the House of Commons of Canada. She also agreed to convey the content of the démarche to the Department of Foreign Affairs, Trade and Development of Canada for appropriate action.

Ministry of Foreign Affairs

Colombo

20 May, 2022

.............................................

## මාධ්‍ය නිවේදනය

## මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කැනඩාව වෙත සිය දැඩි විරෝධය පළ කරයි

ශ්‍රී ලංකාවෙ සිදු වූ බව සඳහන් වන දමිළ ජන සංහාරය පිළිබඳ යෝජනාවක් 2022 මැයි 18 වැනි දින කැනේඩියානු පාර්ලිමේන්තුවේ දී සම්මත කරගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ දැඩි විරෝධය සහ දැඩි කනස්සල්ල විදේශ කටයුතු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

2022 මැයි 20 වැනි සිකුරාදා දින ශ්‍රී ලංකාවේ කැනේඩියානු වැඩ බලන මහ කොමසාරිස් ඇමැන්ඩා ස්ට්‍රෝහන් මහත්මිය සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවති හමුවකදී, මෙම යෝජනාවේ අන්තර්ගත සාවද්‍ය තොරතුරු තරයේ ප්‍රතික්ෂේප කළ විදේශ අමාත්‍යවරයා, මෙම සාවද්‍ය අන්තර්ගතය කැනේඩියානු රජයේ ස්ථාවරය වන "ශ්‍රී ලංකාව තුළ ජන සංහාරයක් සිදු වූ බවට කිසිවක් අනාවරණය වී නොමැත" යන්න සමඟ මූලික වශයෙන් නොගැළපෙන බවත් ඊට පරස්පර වන බවත් අවධාරණය කළේය. නිශ්චිත නෛතික අර්ථ සහිත එවැනි තාක්ෂණික යෙදුම් ප්‍රවේශමෙන් සහ වගකීමෙන් යුතුව භාවිත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන් අමාත්‍ය පීරිස් මැතිතුමා, පෙනී යන පරිදි කැනේඩියානු රජයේ ඕනෑම ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු එය අනුමත කිරීම හේතුවෙන් මතුවන අන්තරායන් පිළිබඳව ද සඳහන් කළේය.

එම යෝජනාවේ ඇති සාවද්‍ය සහ අගතිගාමී ස්වභාවය මෙන්ම එවැනි හැසිරීම් හේතුවෙන් ශ්‍රී ලංකාව පිළිබඳව පොදු සන්දර්භය තුළ ජනිත වන නිෂේධාත්මක අදහස් සැලකිල්ලට ගත් විදේශ කටයුතු අමාත්‍යවරයා, එම යෝජනාවේ අඩංගුවැරදි නිවැරදි කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස කැනේඩියානු රජයෙන් ඉල්ලා සිටියේය. ශ්‍රී ලංකාව සහ කැනඩාව අතර දශක හයකට අධික කාලයක් මුළුල්ලේ පවතින ශක්තිමත් ද්විපාර්ශ්වික සබඳතා සැලකිල්ලට ගනිමින් මෙම දෙවැනි ඉල්ලීම ඉදිරිපත් කරන ලදී.

මීට ප්‍රතිචාර දැක්වූ වැඩ බලන මහ කොමසාරිස් ස්ට්‍රෝහන් මහත්මිය, කැනඩාවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ දී සම්මත වූ පුද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවේ බැඳීම් රහිත, ව්‍යවස්ථාමය නොවන ස්වභාවය පිළිබඳව සඳහන් කළේය. නිසික්‍රියාමාර්ග ගැනීම සඳහා දේශපාලනික පියවරෙහි අන්තර්ගතය කැනඩාවේ විදේශ කටයුතු, වෙළඳ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට ද එතුමිය එකඟ වූවාය.

විදේශ කටයුතු අමාත්‍යාංශය

කොළඹ

2022 මැයි 20 වැනි දින

........................................

**ஊடகவெளியீடு**

**கனேடியநடாளுமன்றபொதுச்சபையின்பிரேரணைக்குஇலங்கைகடும்எதிர்ப்பைபதிவுசெய்தது**

2022 மே 18ஆந் திகதி கனேடிய நாடாளுமன்றத்தில் இலங்கையில் தமிழர்கள் இனப்படுகொலை செய்யப்பட்டதாகக் கூறப்படும் பிரேரணை ஏற்றுக்

2022 மே 20, வெள்ளிக்கிழமை வெளிநாட்டு அலுவல்கள் அமைச்சில் இடம்பெற்ற இலங்கைக்கான கனடாவின் பதில் உயர் ஸ்தானிகர் அமண்டா ஸ் 'இலங்கையில் இனப்படுகொலை நடைபெற்றதாகக் கண்டறியப்படவில்லை' என்ற கனடா அரசாங்கத்தின் நிலைப்பாட்டிற்கு அதன் தவறான பொரு

இந்த பிரேரணையின் தவறான மற்றும் பாரபட்சமான தன்மை மற்றும் இத்தகைய நடத்தையின் விளைவாக பொது களத்தில் உருவாகியுள்ள இலங்கை

இதற்கு பதிலளிக்கும் விதமாக, பதில் உயர்ஸ்தானிகர் ஸ்ட்ரோஹான், கனடாவின் நடாளுமன்ற பொதுச் சபையில் ஏற்றுக்கொள்ளப்பட்ட தனிப்பட்ட

வெளிநாட்டு அலுவல்கள் அமைச்சு,

கொழும்பு

2022 மே 20